© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ජාතික අධ්‍යාපන ආයතනය National Institute of Education

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025
# පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය - 2024

| | |
|---|---|
| **BD1151** | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පළමු බස (සිංහල)<br>**First Language (Sinhala) for Primary Education** |

මූලාකෘති ප්‍රශ්න පත්‍රය — කාලය : පැය තුනයි

*උපදෙස් :-*

- I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- I කොටසේ පිළිතුරු පත්‍රය, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.

---

විභාග අංකය : ……………..………..

## I කොටස

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

01. (i) එක්තරා ළදරුවෙක් බහ තෝරන වියේ දී ප්‍රදර්ශනය කළ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. එම ලක්ෂණවලට අදාළ භාෂා සංවර්ධන අවස්ථාව ලියන්න.

(අ) එක් ශබ්දයක් එක දිගට හඬ නැගීම

........................................................................................................................

(ආ) ශබ්ද දෙකක් මාරුවෙන් මාරුවට හඬ නැගීම

........................................................................................................................

(ඉ) වචනයකින් හෝ දෙකකින් යම් අදහසක් කෙටියෙන් පැවසීම

........................................................................................................................

(ලකුණු 03යි)

(ii) ළදරුවෙකුගේ බහ තේරීම වාග් විද්‍යාඥයෝ ........................................................................... නමින් හඳුන්වති. (ලකුණු 01යි)

(iii) ළදරුවන්ගේ භාෂා සංවර්ධනය පිළිබඳ අදහස් දැක් වූ විද්‍යාඥයෙකු නම් කරන්න.

........................................................................................................................

(ලකුණු 01යි)

---

2 පිටුව බලන්න

02. ප්‍රාථමික ශ්‍රේණියක ඉගැන්වීම සඳහා නවක පත්වීම් ලද ගුරුවරියකට වාර සැලසුම් සකස් කිරීමට අවශ්‍ය විය.

(i) වාර සැලසුම් සකස් කිරීම සඳහා ඇය සපයා ගත යුතු ලේඛන **තුනක්** නම් කරන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(ලකුණු 03යි)

(ii) වාර සැලසුමක් සකස් කර ඉගැන්වීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(ලකුණු 02යි)

***සටහන :***

- මෙම ප්‍රශ්න පත්‍රයේ I කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න අටකින් සමන්විත වේ.
- I කොටසෙහි සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 05 බැගින් ප්‍රශ්න අට සඳහා ලකුණු 40ක් හිමි වේ. (ලකුණු 05 $\times$ 8 = ලකුණු 40යි)

* *

*3 පිටුව බලන්න*

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025

## පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය – 2024

| BD1151 | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පළමු බස (සිංහල)<br>First Language (Sinhala) for Primary Education |
|---|---|

මූලාකෘති ප්‍රශ්න පත්‍රය

## II කොටස

- ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

01. නවක ගුරුවරු සඳහා පැවති වැඩමුළුවක දී ගුරුවරුන් විසින් සකස් කර භාවිත කළ යුතු සැලසුම් වර්ග කිහිපයක් පිළිබඳ සාකච්ඡා විය. එක් එක් සැලසුම් කුමන අවස්ථාවක දී කුමන අරමුණකින් පාවිච්චි කළ යුතු දැයි එක්තරා ගුරුවරියකට ගැටලුවක් පැන නැගුණි. ඒ සඳහා ඔබ ලබා දෙන පිළිතුරු මොනවා ද?

   (i) එක් කාලච්ඡේදයක පන්තිකාමර ඉගෙනුම් අවස්ථාවක් ඵලදායී කර ගැනීම සඳහා භාවිත කළ යුතු සැලසුම් වර්ගය කුමක් ද? (ලකුණු 01යි)

   (ii) ඉහත (01) (i) සඳහා ඔබ සඳහන් කළ සැලසුමක තිබිය යුතු ප්‍රධාන අංග **තුනක්** නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iii) ඵලදායී ඉගෙනුම් අවස්ථාවක් සඳහා සුදුසු සැලැස්මක් පිළියෙල කරන්න. (ලකුණු 08යි)

02. ප්‍රාථමික පන්තිකාමරයක ඉගැන්වීම ආශ්වාදජනක අත්දැකීමක් වන්නේ මනා අවබෝධයකින් හා සැලසුමකින් යුතු ව ඉගැන්වීමෙනි. ඒ පිළිබඳ පරිචය පරීක්ෂා කිරීම සඳහා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   (i) ප්‍රාථමික මව්බස විෂයමාලාව යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02යි)

   (ii) ප්‍රාථමික මව්බස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත වන

   (අ) ඉගෙනුම් ද්‍රව්‍ය **දෙකක්** හා

   (ආ) ඉගැන්වීම් ද්‍රව්‍ය **තුනක්** ලියන්න. (ලකුණු 05යි)

   (iii) (අ) ඵලදායී ඉගැන්වීමක් සඳහා තෝරා ගන්නා ලද ඉගෙනුම් ද්‍රව්‍යයක් ප්‍රශස්ත ව භාවිත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** ලියන්න.

   (ආ) ඕනෑ ම ඉගෙනුම් ද්‍රව්‍යයක් සැලකිල්ලට ගෙන, එම ඉගෙනුම් ද්‍රව්‍යය භාවිත කරන ආකාරය ඉහත (iii) (අ) සඳහා ඔබ ලියූ කරුණු යටතේ විස්තර කරන්න. (ලකුණු 08යි)

*සටහන :*

- මෙම පත්‍රයේ II කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න හයකින් සමන්විත වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 15 බැගින් හිමි වේ.
- II කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ප්‍රශ්න හතරක් සඳහා ලකුණු 60ක් හිමි වේ (ලකුණු 15 $\times$ 4 $=$ ලකුණු 60යි).

* * *